**ශීර්ෂය 244 - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

**----------------------------------------------------------------------------------------------------**

ශීර්ෂය 244 - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 22 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

**------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**---------**

**2.1 විසර්ජන ගිණුම**

**-----------------**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

**------------------------------**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 55.03 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 50.15 ක් උපයෝජනය කර තිබුණු අතර දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4.88 ක් හෙවත් සියයට 8.87 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 49.93 | 47.07 | 2.86 | 5.73 |
| මූලධන | 5.10 | 3.08 | 2.02 | 39.61 |
| **එකතුව** | **55.03** | **50.15** | **4.88** | **8.87** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක **24401** යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.00 | 1.99 | 1.30 | 1.88 | 12.00 | 8.07 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ 2016 දෙසැම්බර් 31 දිනට අංක 6000/0000/00/0018/0044/000 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 25,200 ක් විය.

## 2.4 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ අංක 7002/0000/00/0395/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 492,510 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

-----------------------

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

------------------------------------------------

**3.1 විසර්ජන ගිණුම**

------------------

**අයවැය විචලනය**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 29 දිනැති අංක 07/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2 ඡේදය අනුව ඉන්ධන සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 15 ක් හා ප්‍රවාහන සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක අනිවාර්ය ඉතිරි කිරීමක් සිදු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) වැය විෂයයක් යටතේ වූ රු.200,000 මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 68 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

--------------------------------------

**අයවැය ඇස්තමේන්තුව, ප්‍රසම්පාදන සැලැස්ම හා සත්‍ය වියදම**

------------------------------------------------------------------

2016 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවේ ප්‍රසම්පාදන කටයුතු සඳහා වෙන් කරන ලද මුදල හා ප්‍රසම්පාදන සැලැස්ම මඟින් දක්වා ඇති මුදල අතර රු. 2,600,000 ක වෙනස්කම් පැවතුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

---------------------------

**බේරුම් නොකළ බැරකම්**

---------------------------

විසර්ජන ගිණුමේ හා බැරකම් ලේඛනයේ සඳහන් බැරකම් අතර රු. 97,904 ක වෙනස්කම් විය.

**3.4 කාර්යසාධනය**

----------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) රේගු නඩු පිළිබඳ අභියාචනා සම්බන්ධයෙන් වාර්තා ඉල්ලා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට ලිපි යැවීම හැර වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් විගණිත දිනය වූ 2017 සැප්තැම්බර් 12 දින විටත් ගෙන නොතිබුණි.

(ආ) මෝටර් වාහන ආනයන ප්‍රතිපත්තිය හා මෝටර් වාහන කර්මාන්තයේ එකලස් කිරීමේ ප්‍රතිපත්තියට අදාලව කෙටුම්පත් ප්‍රතිපත්ති 2017 සැප්තැම්බර් 12 දින වන විටත් සකසා අවසන් කර නොතිබුණි. කෙසේ වුවද නව ප්‍රතිපත්ති සැකසීම වෙනුවට පවතින ප්‍රතිපත්ති සංශෝධනය කර ඇති බව දෙපාර්තමේන්තුව විසින් 2017 සැප්තැම්බර් 29 වන දින විගණනයට දන්වා තිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම තුළ ප්‍රධාන ආනයන හා අපනයන නිෂ්පාදන 50 ක් ලැයිස්තුගත කිරීම යෝජිත වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ යුතු වුවද, 2017 සැප්තැම්බර් 29 වන දින වනවිටත් එසේ සිදු කර නොතිබුණි.

(ඇ) රේගු ආඥා පනතේ 19 (අ) (1) හා (2) ප්‍රකාරව, රේගු තීරු බදු නිදහස් කිරීම් පිළිබඳ විස්තර 2010 වර්ෂයේ සිට 2017 සැප්තැම්බර් 12 දක්වා ගැසට් පත්‍රයේ පළ කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අදාළ කටයුතු සිදුකර නොතිබුණි.

(ඉ) කාර්යසාධන වාර්තාව අනුව, 2016 වර්ෂය තුළදී රේගු ආඥා පනතේ 19(අ)(2) වගන්තිය යටතේ තීරුබදු කපා හැරීම් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 2129 ක් වූ අතර එම බලපත්‍ර යටතේ ලබාදෙන ලද තීරුබදු සහන වටිනාකම් පිළිබඳ විස්තර එම වාර්තාවෙහි ඇතුලත් කර නොතිබුණි.

(ඊ) රේගු ආඥා පනතේ 19 (අ) වගන්තිය ප්‍රකාරව රේගු බදු නිදහස් කිරීමේ ක්‍රියාවලියේදී දෙපාර්තමේන්තුව විසින් මෙම නිදහස් කිරීම් පිළිබඳව සුපරීක්ෂාකාරීව කටයුතු කළ හැකි පරිදි වැඩිමනක් තොරතුරු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) රේගු ආඥා පනතේ 22 වගන්තිය යටතේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ආනයනය කරනු ලබන භාණ්ඩ බලපත්‍රයෙහි සඳහන් පරිදි නැවත ප්‍රතිඅපනයනය කිරීම සඳහා අනුමැතීන් ලබාදීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් වේ. එසේ වුවද එය සිදුකරන්නේද යන්න පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් සකසා නොතිබුණු අතර ප්‍රතිඅපනයනය නොකරන ලද භාණ්ඩ පවතී නම් ගතයුතු ක්‍රියාමාර්ගය පිළිබඳවද සඳහන් කර නොතිබුණි.

(ඌ) රාජ්‍ය ආයතන සඳහා ආනයනය කරනු ලබන භාණ්ඩ වෙනුවෙන් රේගු බදු ගෙවීමට එම අවස්ථාවේදී ආයතනවල ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවනවිට අදාල භාණ්ඩ අප්‍රමාදව නිදහස් කර ගැනීම සඳහා ගෙවිය යුතු රේගු බදු වර්ෂය අවසානයේදී ඉතිරි වූ ප්‍රතිපාදන මගින් ගෙවීමේ එකඟතාවය මත භාණ්ඩ නිදහස් කිරීමට අනුමැතීන් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකල පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2007 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාල ශ්‍රී ලංකා රේගුවේ තොරතුරු අනුව, ඉහත කී හිඟ බදු මුදල වූ රු.මිලියන 21,648.55 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් වී නොතිබුණි. එසේම එම හිඟ මුදලෙහි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ නියෝගයන් මත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත භාණ්ඩ නිශ්කාශනය කර ගැනීම සඳහා නිකුත් කළ බලපත්‍ර වෙනුවෙන් 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු.මිලියන 185.44 ක හිඟ මුදල්ද පැවතුණි.

(ii) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2015 දෙසැම්බර් 31 දිනට හිඟ බදු ශේෂය රු.මිලියන 19,497.55 ක් වූ අතර වර්ෂය තුළ සහන ලබා දීම් රු.මිලියන 5,707.65 ක් විය. වර්ෂය තුළ අයකර ගැනීම් රු.මිලියන 3,556.65 ක් වූ

බැවින් 2016 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.මිලියන 21,648.55 ක් විය. 2015 දෙසැම්බර් 31 දිනට මෙසේ හිඟහිටි ආයතන 15 ක එදිනට පැවති රු.මිලියන 9,996.77ක ශේෂයම, 2016 වර්ෂය අවසානයේදී නොවෙනස්ව පැවති බව නිරීක්ෂණය වූ අතර හිඟ ශේෂ අයකර ගැනීමේ ප්‍රතිශතය 2015 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂයට සාපේක්ෂව සියයට 18 ක වැඩිවීමක් විය. මේ හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතුද සිදු කර නොතිබුණි.

(iii) කෙසේ වුවද, ඉදිරි ගෙවීම් ක්‍රම යටතේ බදු ගෙවීම් සඳහා අනුමැතිය ලබාදීම් සම්බන්ධව ලේඛණයක් දෙපාර්තමේන්තුව විසින් පවත්වා නොතිබුණි. එම අනුමැතීන්වලට අදාලව භාණ්ඩ නිශ්කාශනය කර ගෙන ඇද්ද යන්න පිළිබඳව හෝ දෙපාර්තමේන්තුව දැනුවත් වී නොතිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

**3.5 මානව සම්පත් කළමණාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 11 | 03 |
| (ii) තෘතියික මට්ටම | 03 | 03 | - |
| (iii) ද්විතියික මට්ටම | 28 | 23 | 05 |
| (iv) ප්‍රාථමික මට්ටම | 13 | 13 | - |
| **එකතුව** | **58** | **50** | **08** |